

# හරුන් සමග මොහොතක්

## සුළං කුරුල්ලෝ සෙමින් ඉගිල්ලී .....

'හලෝ' ..... දුරකථනයෙන් මතුවූයේ කාන්තා කටහඬකි.
'මම සන්නස පත්තරෙන් කතාකරන්නේ. හරුන් ලන්ත්‍රා මහත්තයාට කතාකරන්න පුළුවන්ද ?'
'ආ.... පොඩ්ඩක් ඉන්න. හරුන් මේ ඔයාට කෝල් එකක්'

අනතුරුව ඇති වන්නේ මඳ නිහඬියාවකි. දැන් දැන් ඒ නිහඬබව බිඳ මධුර ස්වරයෙන් ඔහු මා ආමන්ත්‍රණය කරනු ඇතැයි බලාපොරොත්තුවෙන් මම සවන් යොමා සිටියෙමි. එක දෙක, දෙක තුන, තුන හතර පහ වෙමින් තත්පර විනාඩි බවට පරිවර්තනය වුවද ඒ මධුර ස්වරය මා සවන් වැකුණේ නැත. ඒ වෙනුවට දුරකථනයෙන් වරින් වර මතුවූයේ නුළා පිඹින්නාක් වැනි හඬක් පමණකි. කිසියම් වරදක් සිදුව ඇති බව හැඟී ගියෙන් මම නැවත කතා කළෙමි.

'අර කලින් කතා කරපු මිස්ට කතා කරන්න පුළුවන්ද ?' මම විමසුවෙමි.
'හලෝ.... ඒ හරුන් තමයි කතා කළේ' විරාමයකින් පසු නැවතත් කාන්තා හඬ.
'මට කිසිම දෙයක් ඇහුණේ නෑනේ.'
'හරුන්ට දැන් කතා කරන්න ටිකක් අමාරුයි. ටැලිෆෝන් එකෙන් කතා කරනකොට ඇහෙන්නේ නැතුව ඇති'

*ලන්ත්‍රා යුවලගේ දුක සැප විමසා බැලීමට, ඔවුන්ට උපකාරයක් කිරීමට රිසි පාඨක ඔබ වෙනුවෙන් ඔවුන්ගේ නිවෙසේ දුරකථන අංකය (011) 4927000*

හරුන් ලන්ත්‍රා හමුවී 'සන්නස' වෙනුවෙන් සුහද පිළිසඳරකට දින නියම වන්නේ මේ දුරකථන සංවාදයෙන් අනතුරුවය. ලන්ත්‍රාගේ බිරිය අතාරිත් ලන්ත්‍රා ලබාදුන් මග සළකුණු අනුව, නියමිත දින පෙරවරුවේ මම කැළණිය විහාරය ආසන්නයේ ඇති ගල්බොරුල්ල හන්දියට පැමිණියෙමි.
'ඒ හරියට ඇවිල්ලා ඕනේ කෙනෙක්ගෙන් අහන්න හරුන් ලන්ත්‍රාගේ ගෙදර කොහෙද කියලා. පොඩි ළමයෙක් පුළුත් කියයි. අපි ඉන්නේ පොල්හේන ස්කීම් එකේ එෆ් හතලිස් දෙකේ'.

පෙරදා අතාරිත්ගෙන් ලද උපදේශය සිත දරා මම ගල්බොරුල්ල හන්දියේදී හමුවූ තරුණයෙකුගෙන් හරුන් ලන්ත්‍රාගේ නිවෙස කොහිදැයි විමසුවෙමි.
'හරුන් ලන්ත්‍රා.... මි මි කවුද ඒ. මේ හරියේද ඉන්නවා කිව්වේ. මොනව කරන කෙනෙක් ද? අර ත්‍රිවිල් පාක් එකෙන් ඇතුලට නැත්ද ?'

පිළිවෙළකට ඇඳ, මනාව හිස පීරා, මෝස්තරයකට රැවුල සකසා, කණක කරාඹුවක්ද පැළඳ සිටි තරුණයා විපිළිසර වෙමින් පැවසුවේය. අනතුරුව මම ගොඩවැදුණේ අසළ වූ කුඩා වෙළඳ සැළකටය. මැදි වයස පසු කළ පුන් කිතිපදෙනෙකුම එහි සිටියහ. හරුන් ලන්ත්‍රා කවුරුන්ද යන්න සම්බන්ධයෙන් ඔවුන්ට ගැටළුවක් තිබුණු බව නොපෙණුනද ඔවුන්ගෙන් කිසිවෙකු ද ලන්ත්‍රාගේ නිවෙස ඇති ඉසව්වක් දැන නොසිටියහ. අවසන පොල්හේන නිවාස යෝජනා ක්‍රමය ඇති තැන සොයාගෙන එහි පැමිණි විට ලන්ත්‍රා පදිංචිව සිටින නිවෙස සොයාගැනීම එතරම් අපහසු නොවූයේ ඒ නිවෙසට යාබද නිවෙසක් අලුත්වැඩියා කරන අයෙකු අතරමගදී හමුවූ නිසාවෙනි.

ලන්ත්‍රාගේ නව නිවෙස පිහිටියේ පොල්හේන නිවාස සංකීර්ණයේ කුඩා කඳුගැටයකය. එය නව නිවෙස ලෙස හැඳින්වූයේ ජීවිත කාලය පුරාවට තැනින් තැන, පළින් පල කුළී නිවාස සෙවණ ලැබූ ඔහුට මේ නිවෙස මෑතදී ලැබුණක් වූයෙනි. ලන්ත්‍රා යුවල පවසන පරිදි මාසික කුළී පදනමින්, සුළු මුදලක් ගෙවීමෙන් පසු නිවෙස ඔවුන්වෙත සින්තක්කර නිමිවන ලෙස ලබාදී තිබුණේ සනත් ගුණතිලක ය. ජීවිතයේ අවසාන කාලයේ තමන්ටය කියා ගිමිවූ එකම දේපොළේ සින්තක්කර ඔප්පුව ප්‍රදානය කිරීම සඳහා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා පැමිණෙන තුරු ඔවුහු දැන් මාස කීපයක් නිස්සේ බලා සිටිති.

මා නිවෙසේ කුඩා ආලින්දයට පිවිසෙන විට ලන්ත්‍රා සිටියේ තනිවම කාඩ් සෙල්ලම් කරමිනි. මගේ පැමිණීමත් සමග ඔහුගේ සෙවනැල්ල, අතාරිත් මුළුතැන්ගෙය දෙසින් ඉදිරියට පැමිණියාය. යුග කීපයක් සිය ස්වර මාධුර්යයෙන් ශ්‍රාවක සවන් සැනසූ ගායක හරුන් කුමාර් ලන්ත්‍රා සමග සුහද පිළිසඳරේ ප්‍රවේශය සතිටුහන් වන්නේ එලෙසිනි. එහෙත් අවාසනාවකට එය වෙනත් කලාකරුවන් සමග කෙරෙන සම්මුඛ සාකච්ඡාවකින් බොහෝ දුරට විතැන් වූයේ ලන්ත්‍රාට කතා කිරීමට ඇති අපහසුතාව හේතුවෙනි. ඔහු කතාකරන විට පිටවන හඬ අපැහැදිලිය. පවසන දේ තේරුම් ගැනීමට ඇතැම්විට දෙතුන් වරක් නැවත නැවතත් විමසා සිටින්නට සිදුවන්නේය. එවිට ඒ අපහසුතාවයෙන් අප මුදාලන්නට ලන්ත්‍රාගේ තෝල්ක මුදලිකම පවරා ගන්නී අතාරිත්ය. එතැන් සිට අතාරිත් සමග ඉදිරියට ඇදෙන කතාබහ යළි කථානායකයා වෙත යොමුකරගන්නට හැකිවන්නේ අලුත් මාතෘකාවක් සමගිනි.

'දැන් අවුරුදු දෙක තුනක් වෙනවා හරුන්ට කතා කරන්න බැරිවෙලා. පොඩි ඔපරේෂන් එකක් කළොත් මේක හොඳ කරන්න පුළුවන් කියලා දොස්තරලා කිව්වා. ඒකට වුවමනා හැමදෙයක්ම වගේ කරලා තියෙන්නේ. අපි කැමති දවසක කරන්න පුළුවන් කියලා කිව්වා. සනත් තමයි මේ හැමදෙයක්ම කරලා දෙන්නේ.' පිළිසඳර අරඹමින් අතාරිත් කියා සිටියාය.

'කවුද සනත් කියන්නේ'

'සනත් ගුණතිලක. එයා හරුන්ට හරිම ආදරෙයි. මේ ගෙදර හොයලා දුන්නෙත් සනත්. මායෙන් මාසෙට පොඩි ගානක් ගෙවලා අන්තිමේ අපිටම අයිතිවෙන විදිහට. මේකේ ඔප්පුව දෙන්න ජනාධිපතිතුමා එනවා කියලා කියනවා.'

'සනත් ගුණතිලක කියන්නේ ලන්ත්‍රා මහත්තයාලගේ කාලෙට බොහොම පස්සේ කාලෙක කලා ක්ෂේත්‍රයට ආව කෙනෙක්නේ. කොහොමද ලන්ත්‍රා මහත්තයත් එක්ක මේ තරම් හිතවත්කමක් ඇතිවෙන්නේ ?'
'එයා හලුවා. මම ගායකයා'
එවර පිළිතුර හරුන් ලන්ත්‍රාගෙනි. විවරණය අතාරිත්ටය.

'පාටිවලට ගිහිල්ලා තමයි අඳුනාගත්තේ. ඒ කාලෙ වගේම දැනුත් ඉතිං පාටිවලට ලැබෙන ඇරාධනාවලින් නම් අඩුවක් නෑ. ඒත් දැන් යන්නේ කලාතුරකින්. ගියාම හැම කෙනෙක්ම වගේ හොඳට පිළිගන්නවා. කට්ටිය එකතුවෙලා සල්ලි එහෙමත් එකතුකරලා දෙනවා. ඒවයින් තමයි දැන් අපි පිවත්වෙන්නේ'

හරුන් ලන්ත්‍රා ගායන ලෝකයට එක්වන්නේ මීට දශක ගණනාවකට කලිනි. ඔහුගේ මතකය නිවැරදි නම් ඔහු මුලින්ම ගැයූ චිත්‍රපට ගීතය 'මනු ජීවනය ලැබ මේ ලොවේ' ගීයයි. ඒ නාගගම් අධ්‍යක්ෂණය කළ 'ප්‍රේම තරඟය' චිත්‍රපටියටය. ආර්. මුත්තුසාමි සංගීතවත් කළ එම චිත්‍රපටයේ හියුගෝ ෆොන්සිකු නිරූපනය කළ චරිතයට ගී හඬ එක්කළේ ලන්ත්‍රාය. සිරිසේන විමලවීරගේ පොඩි පුතා චිත්‍රපටියට 'කිරි මුනුදු කැළඹිලා' යුග ගීය පී.එස්.බී. රාණි පෙරේරා සමග හරුන් ගායනා කළේද මේ කාලයේදීමය.

'මේ මෑතක් වෙනකම්ම හරුන් චිත්‍රපටිවලට සින්දු කිව්වා. කුණ්ඩලසේකි චිත්‍රපටියේ විජය කුමාරතුංගට 'කෝමල ප්‍රියංඛිකා චාරුලතා' සින්දුව කිව්වා. රත්ජන් රාමනායකටත් කියලා තියනවා. 'ජූරිය ඔබයි' චිත්‍රපටියේ ඒ.'
අතාරිත් අතීතාවලෝකනයක යෙදුනාය.

එදා මෙදා තුර ලන්ත්‍රා ගැයූ ගී අතරින් ජනප්‍රියත්වයට පත් බොහෝ ගී චිත්‍රපටවලට ගායනා කරන ලද ඒවාය. ඒ අතරින් 'සුළං කුරුල්ලෝ සෙමින් ඉගිල්ලී', 'මගේ නාමලී' වැනි ගීත එදා මෙන්ම අදටත් එකසේ ශ්‍රාවක සවන් සනහන්නේය. හරුන් සුළං කුරුල්ලෝ පදවැලට ජීවය දුන්නේ ගාමිණී ෆොන්සේකා වෙනුවෙනි. ටෝනි රණසිංහ සහ පීවරාණි කුරුකුලසූරිය රංගනයෙන් දායක වූ 'ගොපළු හඬ' චිත්‍රපටියට 'මගෙ නාමලි බැඳි ආදරේ සුකුමාලියයි මැණිකේ ඔයා' ගීය ගයමින් ලන්ත්‍රා සිය හඬ මාදූර්යය එක්කළේය. හේ ගැයූ ගී බොහොමයක් ප්‍රේම ගීත වූ අතර ඒවායේ පදවැල්ගි අර්ථය කුළුගැන්වෙන ප්‍රේමාන්විත හඬක් ඔහු සතුවීම දෙවියන් විසින් දුන් තෑගයක්ය යන්න ලන්ත්‍රා යුවලගේ විශ්වාසයයි.

'ඔය සින්දු තමයි මෙයාගේ හුගක් ජනප්‍රිය වුණේ. ඒ වුණාට ඊට වෙනස් වේග රිද්ම සින්දුත් කියලා තියනවා. මෙයාට ගිහින්දි, ඉංග්‍රීසි, දෙමළ, සිංහල හැම භාෂාවකින් ම සින්දු කියන්න පුළුවන්. මුල් කාලේ කියපු ගිහින්දි සින්දුවලින් වැඩි හරියක් තලාද් මෙහමුද්ගේ. දෙමළ සින්දු ඒ.එම්. රාජාගේ. ඒ අයගේ හඬවල්වලට තමයි මෙයාගේ හඬ සමාන වුණේ'

අතාරිත් එලෙස අතීතයේ සැරිසරන අතර ඡායාරූප එකතුවක් තුළ තිබූ එක් ඡායාරූපයක් ලන්ත්‍රා මාහට පෙන්වීය. එහි වූයේ කඩවසම් තරුණයකු සහ ඔහු අසලින්ම සිටින තරමක් කෙසඟ සිරුරකින් යුත් තරුණයෙකි.
'මේ මොහමඩ් රාෆි'
ඉදිරියෙන් සිටින තරුණයාගේ රූපය දක්වමින් ලන්ත්‍රා පැවසුවේය. ඔහු සමග සිටින අනෙක් තරුණයා හරුන් ලන්ත්‍රා බව හඳුනාගැනීම එතරම් අපහසු නොවීය. මීට දශක ගණනාවකට ඉහතදී මේ ඡායාරූපය ගෙන තිබුණේ මොහමඩ් රාෆි සංගීත සංදර්ශණයක් සඳහා මෙරටට පැමිණි අවස්ථාවකදීය.

'රාෆි ලංකාවට ආව වෙලාවේ මෙහෙ අය අහලා තියනවා ලංකාවේ ගායකයන් ගැන. ඒ වෙලාවෙ රාෆි කියලා තියනවා මෙහෙ ඉන්න අයගෙන් හොඳ හඬක් තියන කෙනෙක් හරුන් ලන්ත්‍රා කියලා. ඒ වෙලාවේ හෝල් එකේ මුල්ලක හිටිය හරුන්ව කට්ටිය එකතුවෙලා වේදිකාවට එක්ක ගිහින් තියනවා. සින්දුවක් කියන්න කියලා කිව්වම මෙයා කියලා තියෙන්නේ තලාද් මෙහමුද්ගේ සින්දුවක්. ඉතිං මොහමඩ් රාෆි අහලා අයි ඔයා මගේ සින්දුවලට කැමති නැත්ද කියලා. නෑ මම ඔබතුමාගේ සින්දුවලටත් කැමතියි. ඒ වුණාට වැඩිපුර කියන්නේ තලාද්ගේ සින්දු කියලා මෙයා කියලා.'
ඡායාරූපයට අතාරිත් දුන් කැප්ෂන් එක ලන්ත්‍රා හිස වනා අනුමත කළේය.

ලන්ත්‍රාගේ ගායන දිවියට පසුබිම සැකසෙන්නේ

## හරුන් කුමාර් ලන්ත්‍රා

හරුන් කුමාර් ලන්ත්‍රා 1930 දෙසැම්බර් මස 02 දින මෙළොව එළිය දුටුවේ මැලේ ජාතික ටී.පී.සී. ලන්ත්‍රා සහ වතිදා යුවළගේ දැරියන් හය දෙනෙකුගෙන් යුත් පවුලේ එකම පිරිමි දරුවා ලෙසිනි. මරදාන සහිරා විද්‍යාලයෙන් ලත් අධ්‍යාපනයෙන් පසුව හේවුඩ් ආයතනයට ඇතුළත්ව වැඩිදුරටත් සංගීතය හැදෑරීමෙන් පසු ඔහු ගායකයකු ලෙස සිය වෘත්තිය ජීවිතය ඇරඹුවේය.
සිංහල, දෙමළ, ඉංග්‍රීසි සහ හින්දි භාෂාවලින් ගී ගැයීමෙහි දක්ෂකම් දැක්වූ ඔහුගේ ගී අතරින් බෙහෙවින් ජනප්‍රියත්වයට පත්වූයේ චිත්‍රපට පසුබිම් ගායනය. ඒ අතරින් 'සුළං කුරුල්ලෝ සෙමින් ඉගිල්ලී', 'මගේ නාමලි' වැනි ගීත එදා මෙන්ම අදත් එකසේ ශ්‍රාවක සවන් සනහන්නේය.

1991 වසරේ මුස්ලිම් සංස්කෘතික අමාත්‍යාංශය මගින් පිරිනැමූ 'මුෂික් නූර්'..... 1993 වසරේ කතෝලික සිනමා පර්ෂදය පිරිනැමූ 'ප්‍රණාම'..... 1994 වසරේ මාධ්‍යවේදී සහයෝගිතා පදනමෙන් පිරිනැමුණු 'උපහාර',.... 1997 වසරේ පිරිනැමුණු 'සරසවි',..... 2003 වසරේ 'කලා භූෂණ' යන සම්මාන මෙන්ම 1947-1997 දේශීය සිනමාවේ ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් පිරිනැමුණු ජනාධිපති සම්මානය එදා-මෙදා තුර හරුන් ලන්ත්‍රාගේ ගායන දිවිය වෙනුවෙන් ඔහුට පිදුණු උපහාරයෝය.

කලක් සිනමාවටද, ප්‍රසංග වේදිකාවටද, කැසට් සහ සී.ඩී. නිෂ්පාදකයන්ටද නැතිවම බැරි ගායන ශිල්පියෙකු වූ හරුන් ලන්ත්‍රා මේ වන විට සිය බිරිය සමග හුදකලා ජීවිතයක් ගෙවන්නේ ආර්ථික දුෂ්කරතා පමණක් නොව නොයෙකුත් ව්‍යාධීන්ගෙන්ද පීඩා විඳිමිනි. වසර කීපයකට පෙර උගුරේ ඇතිවූ ආබාධයක් හේතුවෙන් මේ වන විට කතා කිරීමට නොහැකි තත්ත්වයක පසුවන අතර ඔහුගේ බිරිය ඇස් නොපෙනීම හේතුවෙන් පීඩා විඳිමින් සිටින්නීය. එහෙත් ඔවුන්ගේ රෝග පීඩාවන්ට ප්‍රතිකාර ගැනීමට තබා එදිනෙදා අවශ්‍යතාවන් පසුරා ගැනීමට සරිලන ආදායම් මාර්ගයක් හෝ වෙනයම් වත්කමක්ද ඔවුන් සතුව නොමැත.

හරුන් යුවළ සමග මේ සාකච්ඡාව සිදුවන්නේ එවන් පසුබිමකය. .

සංවාදය සහ සේයා රූ
ශ්‍රීලාල් සෙනෙවිරත්න